**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - 2017/2018**

**-----------------------------------------------------------------------------------**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

**------------------------------------------------**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.10,271,929,581 ක් වූ ලැබිය යුතු භාණ්ඩාගාර ප්‍රදාන හා එකතුව රු.23,630,938 ක් වූ ණයහිමියන් වෙනුවෙන් ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයන්හි නිවැරදිභාවය සහ පැවැත්ම සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එකතුව රු.58,422,683 ක් පිරිවැයැති යන්ත්‍රෝපකරණ හා වාහන සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවද, එම ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ණයගැතියන් සහ ලැබිය යුතු දෑ තුල ඇතුලත් එකතුව රු.2,574,321 ක් වූ ණයගැති ශේෂය සහ ලංකා පොහොර සමාගමෙන් ලැබිය යුතු රු.4,993,147 ක ශේෂය එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 6(2) ඡේදය ප්‍රකාරව ඉඩම් විකිණීමේදී ලබන ලාභය වාර්ෂික බදු ගණනයේදී සලකා බැලිය යුතු අතර එම ඉඩම් ප්‍රත්‍යාගණනය කොට ඉන් ජනිතවන ප්‍රත්‍යාගණන අතිරික්තයේ බලපෑම වාර්ෂික විලම්භිත බදු ගණනයේදී සලකා බැලිය යුතු වුවත් සමාගම සතු ඉඩම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 තත්ත්වාගණනය කල මතය**

-----------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරන තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව**

-----------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරන වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු ගිණුම්**

--------------------

වර්ෂ පහකට වඩා පැරණි එකතුව රු.17,021,172 ක් වූ ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ගිණුම්වල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබූ අතර පොහොර මිලදී ගැනිමට අදාල ණය මුදලේ පොලී ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් වශයෙන් රු.161,076,726 ක් අනෙකුත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබූ අතර, එය අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය

| නීති රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103, 104 | 2018 ජුනි මාසය තුලදී සමාගම විසින් අනාවරණය කර ගෙන තිබූ රු.1,349,522 ක් වටිනා පොහොර මෙ.ටොන් 19.4 ක ඌනතාවයක් සහ රු.2,892,000 ක අත්පිට විකුණුම් මුදල් බැංකු ගතකර නොතිබීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණු අතර, පොලිසියට වාර්තා කිරීම, ප්‍රාරම්භක හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීම යනාදී කටයුතුද සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | යම්කිසි කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් කාර්යය නිම වී දින 10 ක් ඇතුලත පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් දස දෙනෙකුට අවස්ථා 19 කදී ලබාදුන් එකතුව රු.373,500 ක අත්තිකාරම් දින 11 සිට දින 58 දක්වා වූ කාල පරාසයකින් ප්‍රමාද කර පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 වෙනුවෙන් සමාගම විසින් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එහි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 880 | ගබඩාභාරකරුවන් විසින් ඇප තැන්පත් කල යුතු වුවද සමාගමේ ගබඩා භාරකරුවන් 07 දෙනෙක් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. |
| (ආ) 2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.290,312,645 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. 70,174,292 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.220,138,353 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය ආදායම රු.105,494,871 කින් වැඩිවීම හා පොහොර මිලදී ගැනීමට අදාල ණය ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාරයෙන් එම ණය පියවීම සඳහා ලැබිය යුතු ශේෂය අතර වෙනස වූ රු.395,599,750 ක් ආදායම් ලෙස හඳුනාගැනීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

(අ) රාජ්‍ය ව්‍යවසාය ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගු කාලීන දැක්මක් සහිතව කළමනාකරණය කල යුතු බැවින් අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවත්, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ ණය කමිටු තීරණයන්ට අනුව සිය නියෝජිතයන්ට ණය පදනමට පොහොර අලෙවි කිරීමේදී රු.මිලියනයේ සිට රු.මිලියන දෙක දක්වා වූ ණය සීමාවන් යටතේ පොහොර අලෙවි කලයුතු වුවද නියෝජිතයන් 09 දෙනෙකුට අනුමත සීමාවන් ඉක්මවා රු.මිලියන 10.89 ක් වටිනාකමැති පොහොර ණය පදනම මත අලෙවි කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටද එම නියෝජිතයන්ගෙන් ණය මුදල් අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ආ) අංක 01- බී තොග ගබඩාවේ 2018 සැප්තැම්බර් 30 දින විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවකට අනුව යූරියා පොහොරවල තොග පොත් අනුව ශේෂය මෙ.ටොන් 3,023.85 ක් වූ අතර, භෞතික ශේෂය මෙට්‍රික් ටොන් 3234.60 ක් විය. මේ අනුව තොග පොත් ශේෂය ඉක්මවා මෙ.ටොන් 210.75 ක භෞතික ශේෂයක් පැවතුණු අතර, මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතු ගිණුම් 07 ක් ආරම්භ කර එකතුව රු.මිලියන 1,395 ක් තැන්පත් කර තිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) අත්පිට විකුණුම් සඳහා 2018 ජනවාරි 24 දින පුද්ගලික ආයතනයකින් ලැබී තිබුණු රු.113,677 ක් වටිනාකමැති චෙක්පත නියමිත දිනට බැංකුවට ඉදිරිපත් නොකිරීම නිසා කල් ඉකුත්වීම මත 2018 මැයි 22 දින බැංකුව විසින් අගරු කර තිබුණු අතර ඊට අදාල මුදල 2018 ඔක්තෝබර් 15 දින වන විටත් අදාල ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුද්ගලික සමාගමකට 2013 වර්ෂයේදී ලබා දී තිබුණු රු.75,814 ක අත්තිකාරම 2018 ඔක්තෝබර් 15 දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 06 ඡේදය ප්‍රකාරව එක් එක් කාර්තුව අවසානයේ ආර්ථික සේවා ගාස්තු එළඹෙන ඊලඟ මාසයේ 20 වන දිනට පෙර ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු එකතුව රු.17,244,452 ක් වූ ආර්ථික සේවා ගාස්තුව 2018 ඔක්තෝබර් 15 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රු.3,476,948 ක් වැය කර දිස්ත්‍රික්ක හයක සවිකර තිබූ වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු 06 ක් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ කාර්යාල පරිශ්‍රයේ වර්ග අඩි 4000 ක් පමණ වන කාර්යාල ගොඩනැගිල්ලක් පසුගිය වර්ෂ 05 කට ආසන්න කාලයක සිට වසා දමා තිබූ අතර, මෙම ගොඩනැගිල්ල පරිහරණයට ගැනීමට හෝ ආදායමක් උපයා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 මාර්තු 06 දින රු.850,000 ක් වැයකර පොහොර මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණු අතර, 2018 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම මිශ්‍රණ යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ අලෙවි කළමණාකරු, ගණකාධිකාරී, සහකාර කළමණාකරු(විකුණුම්) සහ පරිපාලන නිලධාරී යන තනතුරු ඇතුළුව පුරප්පාඩු 28 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමේ සහකාර නීති කළමනාකාරවරිය සමාගම් ලේකම්වරයකු ලෙස කටයුතු කිරීමේ බලපත්‍රය ලබාගෙන තිබියදීත්, ඇයගේ සේවය ලබා නොගෙන බාහිරින් සමාගම් ලේකම්වරයෙකු පත්කර තිබුණි.

**5. තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) සමාගම විසින් හඳුනාගෙන තිබුණු තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවිය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ඉලක්ක මත ළගාවීම මෙන්ම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර ඉලක්ක කරා ලඟා වීම සඳහා සමාගම විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබුණු අතර, එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුලත් කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිට ඉදිරිපත් කල යුතු වුවත් 2017/2018 මූල්‍ය වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිට ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 09 දින විය.

**6.2 ප්‍රසම්පාදනය**

----------------------

**6.2.1 ප්‍රසම්පාදනයන්**

-----------------------

සමාගම සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරගැනීම සඳහා රු.මිලියන 1,929.05 ක් වැයකර තිබුණි.

**6.3 අයවැය පාලනය**

-------------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 15 ක් සම්බන්ධයෙන් අයවැය ගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 40 ට වඩා වැඩි විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------------

සමාගමේ 2015/2016 සහ 2016/2017 යන වර්ෂයන්ට වලට අදාල වාර්ෂික වාර්තා 2018 ඔක්තෝබර් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

-------------------------------

2016/2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.2 ඡේදය යටතේ දක්වා තිබූ, සමාගම වෙනත් ආයතනයකින් බද්දට ගෙන තිබූ ඉඩමකින් නිසි ප්‍රයෝජන ගැනීමට කටයුතු කර නොතිබීම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිවැරදි වී නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයා වෙත යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ගිණුම් පොත්පත් පවත්වා නොගැනීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම් භාවිතයට ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු නොකිරීම. |